# විදේශගත ලාංකික විද්වතුන් හා බුද්ධිගලනය පිළිබඳත් ඔවුන්ගේ දායකත්වය ජාතියේ උන්නතිය වෙනුවෙන් යළි දිනාගැනීමේ වැඩ පිළිවෙලක් සඳහා වූ මූලික කෙටුම්පත

ලාංකික විද්වතුන් විශාල වශයෙන් ලෝකයේ තාක්ෂනික වශයෙන් දියුණු රටවල් තුළ කේන්ද්‍රගත වී ඇති බව ප්‍රචලිතය. මෙම සංසිද්ධිය සඳහා බලපාන කරුණු රාශියක් ඇති නමුදු, මෙතෙක් මේ පිළිබඳව සෑහීමකට පත්විය හැකි අයුරින් ගැඹුරින් සළකා බලා නැති බව අපගේ අදහසයි. තවද මේ පිළිබඳව රට පාලනය කළ කිසිවෙකුට නිශ්චිත වැඩපිළිවෙලක් තිබුණු බවට ද සාක්ෂි නොමැත.

විදේශගත විද්වතුන් හා බුද්ධිගලනය පිළිබඳව දෝෂාරෝපනය හා ද්වේශය පදනම් වූ විග්‍රහයන් ද වරින් වර ඉදිරිපත් කරනු ලබන සීමා බන්ධන, පදනම් විරහිත ආකල්ප මත සකස් වූ නිෂ්පල උත්සාහයන් පමණක් බව තේරුම් ගන්නා අපි, මෙම සංසිද්ධිය පිළිබඳව පුළුල් ලෙස බැලීමටත්, ප්‍රායෝගිකවුත්, සාධාරනවුත් ක්‍රියාමාර්ග යෝජනා කිරීමටත්, එම යෝජනා විද්වතුන් අතර සාකච්ඡාවට ලක් කිරීමත් අරමුණු කරගෙන මෙම කෙටුම්පත සකස්කොට ඇත.

මෙම විග්‍රහයේ අරමුණ, මෙම සංසිද්ධිය යථාර්තවාදී ලෙස තේරුම් ගැනීම මිස, එය සාධාරණීකරනය කිරීම හෝ විවේචනය කිරීම නොවේ. මෙම සංසිද්ධියට පාදක වන මූලික කරුණු තේරුම් ගෙන, විදේශගත විද්වතුන්ගේ දායකත්වය ජාතියේ උන්නතිය වෙනුවෙන්, ඔවුන්ගේ හැකියාව හා උවමනාවන් මත ද පදනම්ව, දිනාගැනීම අද ප්‍රධාන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත යන පදනමේ සිට කරුණු සාකච්චා කිරීමට බලාපොරොත්තු වෙමු.

එහෙත් වත්මන් සමාජ අර්බුදය හමුවේ, මෙම ගැටළුව සම්බන්ධව ඉටුවිය යුතු කාර්ය භාරය සැළසුම් සහගතව කෙරෙනවා වෙනුවට, රාජ්‍යයේ සහාය, මැදහත්වීම මද බව හේතු කොටගෙන, විද්වතුන් විසින් තනි තනිව කරනු ලබන කාර්යයක් බවට පත්ව ඇත.

මේ වූ හේතුව නිසාම, ඒ ගැන යම් කළකිරීමක් ද, හුදකලාවීමක් ද විද්වතුන් අතර පවතින බව ද නොරහසකි. විදේශගත විද්වතුන් ආපසු නොඒමටත්, විදේශයන්හි රැඳෙන අතර මවුබිම වෙත කළ හැකි දායකත්වය වුවත් පුද කිරීම කෙරෙහි උදාසීනත්වයක් ද, මේ නිසා ඉස්මතු වන බව නිශේධ කළ නොහැකි කටුක සත්‍යයක් බවට පත්ව ඇත.

විද්වතුන් විදේශගත වන්නේ ඇයි?

මෙම සංසිද්ධිය විග්‍රහ කිරීමට සරල ක්‍රමයක් හෝ පිළිතුරක් නැත. එකකට වඩා සංකීර්ණ හේතුන් මේ සඳහා බලපාන අතර, සමාජ, ආර්ථික, දේශපාලනමය, විද්‍යාත්මක, අධ්‍යාපනික හා අතිශය පෞද්ගලික මෙන්ම මූල්‍යමය හේතුන් ද මේ අතර වේ.

සමාජ සම්බන්ධතා හා හැකියාවන් මත, වඩා හොඳ ජීවන මට්ටමක් ලබා ගැනීමේ පෞද්ගලික උවමනාව මතම පමණක් විදේශගත වීම්, සහමුලින් බැහැර කිරීමට අප උත්සුක නොවෙමු. නමුදු අධ්‍යාපනික හේතු මත, දැනුම පුළුල් කර ගැනීම හා දැනුම අව්‍යාජ ලෙස ක්‍රියාවට නැඟීමට ඇති ජාතික සීමාවන් තුළ කොටුවෙනු අකමැති, දැනුම හා තාක්ෂණික නිදහස සොයා විදේශගතවන සෑහෙන දෙනෙකු සිටින බව ද අවධාරනය කරමු. තව ද දශක දෙකක් තිස්සේ රට තුළ තිව්ර කරනු ලැබූ ජාතික ගැටළුව හා දකුණේ සිවිල් අර්බුදය නිසාත්, රටේ පවතින පොදු දේශපාලන අර්බුදය ද හමුවේ විශාල වශයෙන් විද්වතුන් රට හැර ගිය බව ද කටුක යථාර්තයක් සේ දකිමු. මෙම සංඛ්‍යාව ලක්ෂ 5ක් පමන වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

ඉහත ඉතාම කෙටියෙන් සටහන් කරනු ලැබූ යථාර්තය හමුවේ, අද අවශ්‍යව ඇත්තේ ප්‍රායෝගික වැඩ පිළිවෙලකි. එම වැඩ පිළිවෙල සැළසුම් කිරීමේ දී, ලාංකීය ජාතියේ ඉදිරි ගමන මෙන්ම විදේශගත විද්වතුන්ගේ පැත්තෙන්ද සළකා බලා සැළසුම් කිරීම අත්‍යවශ්‍ය දෙයකි. තවදුරටත් විදේශ රටවල් තුළ රැඳෙමින් ඔවුනගේ දායකත්වය පුදකරනවා ද නැතිනම් ආපසු තම මව්රටට පැමිණෙනවා ද යන තීරණයත්, ඔවුන්ට කළ හැකි මෙහෙවර හා එම මෙහෙවර වඩා කාර්යක්ෂම ලෙස කළ හැක්කේ කොතැනක සිටිමින් ද යන්නත්, තීරණය කිරීමේ නිදහස ඔවුන්ට දීමත්, එම තීරණය ගැනීම සඳහා ඔවුන් දිරි ගැන්වීමත් වඩා නිවැරදි ක්‍රමය වනවා ඇත. විදේශගත විද්වතුන් ආපසු පැමිණෙන්නේ නම්, එම විද්වතුන්ට මුහුණ දීමට සිදුවන සුවිශේෂ ප්‍රශ්න ගැටළු සාකච්චා කිරීමත් ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීමත්, මෙම ප්‍රායෝගික ක්‍රියාමාර්ගයේ අත්‍යවශ්‍ය සාධකයක් වනවා ඇත. තවද ආපසු පැමිණෙන විද්වතුන් නිශ්චිත සංවිධානාත්මක වැඩපිළිවෙලක් හරහා සම්බන්ධිකරණය කිරීම අත්‍යවශ්‍ය අතර, ඔවුන් යළි පැමිණීම ඉහළම කාර්යක්ෂමතාවයෙන් හා ඔවුන්ගේ සේවය පිළිබඳව ඔවුන් තෘප්තිමත් වන ආකාරයෙන්ද සැළසුම් කළ යුතුව ඇත.

විද්වතුන් සංක්‍රමණයට බලපාන හේතු සාධක තේරුම් ගන්නා අප, "බුද්ධිගලනය" නැවැත්වීමේ අරමුණින් නීති රීති සම්පාදනය කිරීමත්, නිදහසේ දේශසීමාවන් තරණය කිරීම සඳහා ඔවුන්ට ඇති මූලික මිනිස් අයිතිවාසිකම් සඳහා වැට කඩුලු බැඳීමත්, නිෂ්පල පටු ක්‍රියාමාර්ග ලෙස සළකන අතර, ඔවුන් ලෝකයේ කොතැනක සිටියත්, ඔවුන්ගේ දායකත්වය ලාංකීය සමාජයේ ඉදිරිගමනට යොදා ගැනීමට අව්‍යාජ උත්සාහයක් දැරීමටත්, කිසිදු දෙගිඩියාවකින් තොරව කළ හැකි බවද අවධාරනය කරමු.

ජාතිය අද මුණ පා ඇති ගැඹුරු අගාධයෙන් ඉවතට ගෙන අභිමානවත් ජාතියක්, ශක්තිමත් රටක් ලෙස යළි ගොඩනඟා ඉදිරියට ගෙනයාම සඳහා විද්වතුන් හට කළ හැකි මෙහෙවර හා කාර්ය භාරය සඳහා කෙටි කාලීන මෙන්ම දිගු කාලීන පදනමක් මත සකස්වූ වැඩ පිළිවෙලක් යෝජනාකිරීමටත්, මෙම මූලික ලියවිල්ල ප්‍රකාශයට පත් කරන්නෙමු.

විද්‍යාත්මක තාක්ෂණයේ, දැනුමේ, දියුණුව, ඉදිරිගමන, ප්‍රචලිතවීම ජාතික සීමාවන් ඉක්මවා යන බව හොඳාකාරවම දන්නා අප, මෙම විද්‍යාත්මක දැනුම තාක්ෂණය, විශේෂඥ ඥානය, නොයෙක් ඓතිහාසික හේතූන් මත දියුණු බටහිර රටවල් සතුව පවතින බවද හොඳාකාරව තේරුම්ගෙන සිටිමු. මෙම ඓතිහාසික සත්‍යතාවත් දැනුම් සම්භාරය වෙත ළඟාවීම සඳහා ජාතික සීමාවන් අභිබවා යෑමේ ඇති අවශ්‍යතාවය ද අවධාරනය කර සිටිමු.

තවද, රටේ අනාගතය, තාක්ෂනික දැනුම හා දියුණුවට සැබෑ ලෙස දායකවීම සඳහා එම භූමියේ කායිකව රැඳීම අත්‍යවශ්‍ය කොන්දේසියක් යන අදහස ඒ ලෙසින්ම වැළඳ ගැනීමට මැලිවෙමු. සන්නිවේදන විප්ලවයකට මුල පුරා ඇති ලෝකයක තම දායකත්වය පුද කිරීම සඳහා පවතින විද්‍යාත්මක පහසුකම් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවද අවධාරනය කරමු. දුරස්ථ අධ්‍යාපනික දුරස්ථ ප්‍රතිකාර ක්‍රම පවතින ලෝකයක අත්‍යවශ්‍ය එකම කොන්දේසිය වන්නේ නිශ්චිත වැඩපිළිවෙලක අවශ්‍යතාව පමණකි.

විදේශයන් පුරා විසිර සිටින හා තවදුරටත් රැඳෙන විද්වතුන්ගේ "සංචිතයක්" සෑදීම හා ඔවුන් සංවිධානය කිරීමත් අද දවසේ ප්‍රධාන අවශ්‍යතාවයක් හා හෙට ලොවට ශක්තිමත් පියවරක් වශයෙන් දකින අප, මේ සඳහා විද්‍යුත් මාධ්‍යයන් හරහා දත්ත ගබඩාවක් (data base) සකස් කිරීමටත් යෝජනා කරමු. මෙම දත්ත ගබඩාව මගින් ඔවුන්ගේ විශේෂඥ දැනුම අයිති ක්ෂේත්‍රය හා ඔවුන්ට කළ හැකි මැදිහත්වීම ගැන මනා අවබෝධයක් ලබාගත හැක. මෙම දත්ත ගබඩාව සහමුලින්ම ස්වේච්ඡාවෙන් කරනු ලබන දෙයක් පමණක් වනවා ඇත. ජාතියේ ඉදිරිගමන සැළසුම් කිරීම සඳහා අත්‍යවශ්‍ය දායකත්වය මේ මගින් ලබාගැනීමටත් එය ප්‍රතිපත්ති සම්පාදනයට දායක කර ගැනීමටත් ඇති හැකියාව පිළිබඳව සළකා බැලීමටත් දේශපාලකයන්ට බලකර සිටිමු. සාක්ෂි හා පර්යේෂණ දත්ත මත පදනම්වූ තීන්දු ගැනීමට, මෙම ජාත්‍යන්තර දැනුම හා බුද්ධිය යොදාගැනීමට ඇති හැකියාව හා වැදගත්කම ද අවධාරණය කරමු.

පවතින සමාජ අර්බුදය හමුවේ විශේෂයෙන්ද, කලින් සඳහන් කළ හේතු නිසා පොදුවේ ද, මෙම සංසිද්ධිය දිගු කාලීනව ඉදිරියටත් පැවතීමේ යථාර්තය දකින අප විද්වතුන් විදේශගතවීම යථාර්තය නම් විද්වතුන්ගේ විදේශගතවීමද සැලසුම් සහගත ලෙස මෙහෙයවීමටත් (facilitate) ඒ මගින් ලෝකය "බුද්ධි භාණ්ඩාගාරයක්" සකස් කිරීමේ ඇති වැදගත්කම හා හැකියාවන් අවධාරනය කරමු. ලෝකයේ ඉහලම තාක්ෂණික ඥානයන් හා දැනුම කේන්ද්‍රගත වී ඇති සෑම තැනකම, ශ්‍රී ලාංකික විද්වතුන් රැඳවීමටත්, ඒ මගින් රටට අවශ්‍ය තාක්ෂණික හා විශේෂඥ දැනුම චක්‍රව ලබා ගැනීමටත්, ඒවා රටට ගැළපෙන ලෙස සකස් කර ගැනීමටත් ඇති හැකියාව ද දකිමු. රටතුළ තිබෙන අධ්‍යාපන හා දැනුම් පිපාසාව සංසිඳුවීමට වැඩි වැඩියෙන් විද්වතුන් බිහිකිරීමට අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීමටත් විද්වතුන් හිඟ තුන්වන ලෝකයේ රටවල් සඳහා විද්වතුන් සැපයීම මගින් ජාත්‍යන්තර කාර්ය භාරයක් ඉටුකිරීමටත් ඇති හැකියාව අවධාරනය කරමු. මේ මගින්, දැනට කෙරෙන නුපුහුණු ශ්‍රමය අඩු මුදලට රට පැටවීම වෙනුවට පුහුණු ශ්‍රමය හරහා වැඩි විදේශවිනිමයක් උපයා ගැනීමේ හැකියාවද පෙන්වා දෙමු. උගතුන් හා බුද්ධිමතුන්ගේ විදේශගත වීම ගැටළුවක් වෙනුවට ආයෝජනයක් බවට හැරවීමේ ජාතික වශයෙන් වැදගත් කමක් ඇති බවත් ඒ මගින් අවාසිය වාසියට හරවා ගැනීමට ඇති හැකියාවත් සළකා බැලීමට යෝජනා කරමු

ඉහත දැක්වූ තත්ත්වයන් තුළ, පවතින තත්ත්වයන් විග්‍රහ කිරීමෙන් පමණක් සෑහීමකට පත්වීම වෙනුවට, එම ගැටළුවට විද්‍යාත්මක විසඳුම් ලබාගත හැකි ආකාරය ගැන අදාල සමාජ ස්ථරයන් තුළ සාකච්ඡා කිරීම සඳහාත්, ක්‍රියාමාර්ග යෝජනාකොට ඇරඹීම සඳහාත් මූලික පියවරක් මේ ලෙස එළිදක්වමු. ඔබගේ අදහස්, යෝජනා මෙන්ම ක්‍රියාත්මක ලෙස මැදිහත් වීමත් ඉතාමත් අගේ කොට සළකමු.